


## ජෛව විවිධත්වයෙන් සපිරුණු වන වියන

# දොඹගස් කන්ද රක්ෂිතය

**වර්තමානයේ ශ්‍රී ලංකාවේ මුළු වන ආවරණය සියයට 20 දක්වා පහත බැස ඇති අතර, දැනට ඉතිරිව ඇති එම වනාන්තර වුවද ඉහළ මට්ටමක ජෛව විවිධත්වයකින් සමන්විත බව පිළිගැනේ. භෞතික හා දේශගුණික විවිධතාවක් සහිත දිවයිනක් වශයෙන් පිහිටීම අනෙකුත් ආසියාතික රටවල් අභිබවා ඉහළ මට්ටමක ජෛව විවිධත්වයක් ඇතිවීම සඳහා දායක වී ඇත.**

**යූ.පී.එස්. පතිරණ**


ලෝකයේ "ජෛව විවිධාත්මක උණුසුම් ස්ථාන" (Biodiveresity Hotspots) වශයෙන් නම්කර ඇති පරිසර පද්ධතීන් කිහිපයක් පිහිටි රටක් වශයෙන් ද ශ්‍රී ලංකාව ලෝකයේ පිළිගැනීමට ලක්වී තිබේ. ශ්‍රී ලංකාවට පමණක් ආවේණික සත්ත්ව හා ශාක විශේෂ විශාල සංඛ්‍යාවකටද අපගේ වනාන්තර උරුමකම් කියන බවද ලෝකයට රහසක් නොවේ. එබඳු වනාන්තර ගැන කථාකරන විට දෙඹගස්කන්ද වන රක්ෂිතයද නිතැතින්ම සඳහන් කළ යුතුව පවතී.

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පානදුර - රත්නපුර ප්‍රධාන මාර්ගයේ 18 හා 20 වන සැතපුම් කණුවලට ද මායිම් වෙමින් බෝධිනාගල වන සෙනසුනට බටහිරින් දෙඹගස්කන්ද වන රක්ෂිතය පිහිටා තිබේ. නැගෙනහිරින් ඉංගිරිය ඇළත්, දකුණින් කළු ගඟත්, උතුරින් කුඹුරු යායත් මෙම රක්ෂිතයේ අනෙකුත් මායිම් සලකුණු කරති. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති මෙම වන රක්ෂිතයට හෙක්ටයාර 407 ක භූමි ප්‍රමාණයක් ආරම්භයේදී අයත්ව තිබුණද, අද එය හෙක්ටයාර 282 දක්වා පටුවී තිබේ. ප්‍රධාන කඳුමුදුන් හතරක් ද සහිත කුඩා කඳුවැටියෙකින් සමන්විත මෙම වන රක්ෂිතයේ උසම කඳු මුදුන මීටර් 186 ක් පමණ වේ. මි.මී. 4000-4500 ත් අතර සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලබන දෙඹගස් කන්ද වන රක්ෂිතයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියෙස් අංශක 23.4 සිට 32.1 දක්වා ඉහළ පහළ යයි.

දෙඹගස් කන්ද වන රක්ෂිතයට ස්වාභාවික වනාන්තරය, නැවත වගා කරන ලද පයිනස් හා ඇල්බීසියා සහිත ද්විතීයික වනාන්තරය, කළු ගඟ පිටාර ගැලුම් තිම්තයේ වගුරු බිම් හා අනවසර පදිංචිකරුවන් අල්ලා ගත් ගෙවතු ද අඩංගු වේ. ශ්‍රී ලංකා තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව දෙඹගස් කන්ද වන රක්ෂිතය තුළ දැව ශාක වර්ග 176 ක් හඳුනාගෙන ඇති අතර, ඉන් 64 ක් ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ ලෙස සැලකේ. මීට අමතරව මෙහි උඩවැඩියා විශේෂ 30 ක් ද, හඳුනාගෙන ඇති අතර, ඉන් උඩවැඩියා විශේෂ 11 ක් ශ්‍රී ලංකාවට ආවේණික ඒවා බවට දක්වා තිබේ.

වසර කෝටි 40 කට පමණ පෙර මීවන, වැරැල්ල වැනි සංකීර්ණ ශාක වර්ග මෙම මිහිතලය මත හටගත් බව පැවසෙන අතර, ආදිතම යුග වලට අයත් මීවන වර්ග මෙහි පස් කණ්ඩි මත හරිත වර්ණයෙන් දිලිසෙනු දැකිය හැකිය. මෙම රක්ෂිතය තුළ මීවන විශේෂ 32 ක් පමණ වාර්තාවී ඇති අතර, ඉන් 2 ක් ඉතා විරල ගණයේ මීවන විශේෂ ලෙස සැලකේ.

**ශ්‍රී ලංකා තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව දෙඹගස් කන්ද වන රක්ෂිතය තුළ දැව ශාක වර්ග 176 ක් හඳුනාගෙන ඇති අතර, ඉන් 64 ක් ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ ලෙස සැලකේ. මීට අමතරව මෙහි උඩවැඩියා විශේෂ 30 ක් ද, හඳුනාගෙන ඇති අතර, ඉන් උඩවැඩියා විශේෂ 11 ක් ශ්‍රී ලංකාවට ආවේණික ඒවා බවට දක්වා තිබේ.**



මෙහි දවැන්ත ගස්වල එල්ලී සරුවට වැඩුනු අපිශාක අතර ලා කොළ පැහැති පත්‍ර සහිත රාජ බේදුරු මීවනය සුලභව දක්නට ලැබේ. මීට අමතරව වනයේ වැඩී ඇති මීවන වර්ග අතර දික්ව එල්ලා වැටෙන පත්‍ර සහිත පටී ධාතු නම් මීවන වර්ගය ද වනයට අමුතු අලංකාරයක් ලබාදී තිබේ. මෙම රක්ෂිතයේ ප්‍රමුඛව දැකගත හැකි ශාක විශේෂ වනුයේ හොර ශාක පවුලේ සාමාජිකයන්ගෙන් සැදි ශාක විශේෂයි. වනය විනාශවූ ස්ථානවල පයිනස්, ඇල්බීසියා හා හොරගස් නැවත වගාකර තිබේ. දුර්ලභ ගණයේ ඖෂධ පැළෑටි රැසකට ද මෙම වනය නිජබිමවී ඇත. ඒ අතර මහා හැඩයා හා කුඩා හැඩයා ද වැදගත් තැනක් උසුලයි.

පෝටාවැල්, පුස්වැල්, වේවැල්, වෙතිවැල්ද වනය පුරා දැකගත හැකි අතර පහළ තිම්නයෙහි ඉහළට වැඩුනු මාවේවැල් මෙන්ම පඹ වැල් ද සුලභ දසුනකි. වනයේ වදුල සමග වැඩුනු දෝතළු පුවක්, කිතුල්ගස්, ඉඳිගස්, මඩු වැනි තාල වර්ගයේ ගස්ද අතරින් වනය තුළට පිවිසෙන මිනිසෙකුගේ තැවුල් මනසකට වන ආරණ්‍යයක පවතින සුන්දර ශාන්ත සුවයක් ලබා දීමට දෙඹගස්කන්ද වන රක්ෂිතය සැදී පැහැදී සිටින බවද තොරහසකි.

සුවිශේෂ පාරිසරික පද්ධතියක් ලෙස දෙඹගස් කන්ද රක්ෂිතය ශ්‍රී ලංකාවේ වඩාත් ඉහළ ජෛව විවිධත්වයකින්ද සමන්විත වේ. ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ මෙන්ම දැනට වඳවීයාමේ තර්ජනයට මුහුණදී ඇති සත්ත්ව විශේෂ රැසකට ද දෙඹගස් කන්ද වනය නිජබිම් සලසා දී තිබේ. ඒ අතර, සමතල විශේෂ 77 ක් ද, මත්ස්‍ය විශේෂ 36 ක් ද, උභය ජීවීන් 15 ක් ද, උරග විශේෂ 27 ක් ද, ක්ෂීරපායීන් විශේෂ 14 ක් ද, මෙතුළ වාර්තා වී තිබේ. ඉන් උභය ජීවීන් 5 ක්, මත්ස්‍ය විශේෂ 12 ක්, හා උරග විශේෂ 9 ක් ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ ලෙස සැලකෙන අතරම ඉන් සමතල විශේෂ 17 ක් මාළු විශේෂ 17 ක් උභය ජීවීන් 5 ක් උරග විශේෂ 14 ක් හා ක්ෂීරපායීන් වර්ග 5 ක් දැනටමත් වඳවීයාමේ තර්ජනයට මුහුණදී ඇති සත්ත්ව විශේෂ අතරට ගැනේ. ශ්‍රී ලංකාවට ආවේණික පිණුම් කටුස්සා හා කරමල් බෝදිලිමාද, ලේමැඩිල්ලා හා සර්ප හීරළුවාද මෙම වනයේ වෙසෙන අතර, ඉතා දුර්ලභ සර්ප විශේෂයක් වන වයිර හාල්දණ්ඩා සමග, පිඹුරා දියනයා ආදීහුද වෙසෙති. මෙහි දිය පහරවල් ආශ්‍රිතව වෙසෙන ජල ජීවීන් අතරට පුල්ලි අහිරාවා, බුලත් හපයා , දෙපුල්ලියා හාල්මල්දණ්ඩියා, ගල්පාඩියා, තලහඳයා ඉරි අහිරාව, දංකොළ සාලයා හා අඩුබරි ඉස්සාද



ඇතුළත් වන අතර, ඉන් බුලත් හපයා, දෙපුල්ලියා හා හල්මල් දණ්ඩියා යන මත්ස්‍ය විශේෂ 1988 රතු දත්ත පොතේ වඳවීයාමේ තර්ජනයට ලක්වූවන් ලෙසට නම්කර තිබේ. මීට අමතරව ශ්‍රී ලංකාවට ආවේණික පුල්ලි අහිරාවා නැමති මත්ස්‍යයා දිවයිනේ මෙතෙක් වාර්තාවී ඇත්තේ දෙඹගස් කන්ද රක්ෂිතය හැරුණුවිට තවත් දෙතැනකින් පමණි. මෙහි වෙසෙන උභය ජීවීන් අතර ගල්පර මැඩියා ශ්‍රී ලංකාවට පමණක් ආවේණික මත්ස්‍ය විශේෂයකි.

දෙඹගස් කන්ද වන රක්ෂිතය පක්ෂීන් නිරීක්ෂණය කරන්නන්ටද කදිම කෙම් බිමකි. ශ්‍රී ලංකාවේ දැනට වාර්තා වී ඇති පක්ෂීන් 433 න් 150 කට අධික සංඛ්‍යාවක් මෙම රක්ෂිතය තුළ නිරීක්ෂණය කළහැකි බව කියැවේ. එපමණක් නොව, ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂී විශේෂ 27 න් 13 ක්ම මෙම රක්ෂිතය තුළදී හමුවේ. ඒ අතර හබන් කුකුළා, වලිකුකුළා, ගිරාමලිත්තා, අළු ගිරවා, බට ඇටිකුකුළා, මූකලන් බස්සා, අළු කැඳැත්තා, මූකලන් කොට්ටෝරුවා හීන් කොට්ටෝරුවා හිස කළු කොණ්ඩයා පුල්ලි වල් අවිච්චියා හිස දුඹුරු දෙමලිච්චා හා තිල් පිලලිච්චාද වෙති. ඉතා දුර්ලභ පක්ෂියෙකු වන ශ්‍රී ලංකාවට ආවේණික බට ඇටිකුකුළා නිරීක්ෂණය කළහැකි වනාන්තර අතලොස්සෙන් එකක් ලෙසද දෙඹගස් කන්ද රක්ෂිතය සැලකේ. මීට අමතරව, දේශීය පක්ෂීන් අතරින් විශේෂ ස්ථානයක් ගනුලබන මහ ගිනි කුරුල්ලා, ගෙඹිකට බස්සා, දැකැති දෙමලිච්චා, හිසකළු දෙමලිච්චා, කොණ්ඩ කවුඩා, බඩරතු රාජාලියා, මාළු බකමූණා, බස්සා හා උකුණු බස්සාද සංක්‍රමණික පක්ෂීන් අතරින් සුදුරෙදි හොරා, අවිච්චියා, දුඹුරු අස්පටියා, කෝනකොකා, තිල් බට්ටි කුරුල්ලා, දුඹුරු මැසිමාරා හා උස දුඹුරු මැසිමාරා වැනි පක්ෂි විශේෂද දෙඹගස් කන්ද රක්ෂිතය තුළදී දැකබලා ගැනීමට හැකිවීම මෙම වන රක්ෂිතයේ ඇති වැදගත්කම වඩාත් ඉහළ නංවයි.

දැනට මෙම වන රක්ෂිතයේ අනාගත පැවැත්ම උදෙසා එල්ලවී ඇති බරපතල තර්ජනද මෙහිදී අමතක කළයුතු නොවේ. නීති විරෝධී දැව සංහාරය, කැළෑ හෙළි කිරීම, වනයේ වටිනා පැළෑටි, මත්ස්‍ය වර්ග, උරගයන්, සමතලයන් ආදී දෑ මිනිසුන් විසින් රැගෙනයාම, වියළි කාලයේ කැළෑ ගිනි තැබීම, රක්ෂිතය අසබඩ, කළුගං නිම්නයේ පාලනයකින් තොරව වැලි ගොඩදැමීම, පමණක් නොව යාබද පිහිටි වන සේනාසනයේ සිදුවන සංවර්ධන වැඩකටයුතු ද මෙම වන රක්ෂිතයේ තිරසාර පැවැත්මට තර්ජනයක් වී පවතී. මීට අමතරව මෙම පරිසර පද්ධතියේ වටිනාකම පිළිබඳ අවට ජනතාව දැනුවත්වී නොසිටීමද ප්‍රධාන අඩුපාඩුවක්වී පවතී. ඉහත තර්ජනයන් හමුවේ මෙම සුවිශේෂී පරිසර පද්ධතිය කොතෙක් කල් සුරැකී පවතීද යන්න ඉතා අවිනිශ්චිත බව මෙහිදී අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත. ❑